කාර්යසාධන වාර්තාව - 2012

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

පටුන

		පිටු අංකය
1.	දැක්ම, මෙහෙවර හා දෙපාර්තමේන්තුවේ කාර්යයන්	2-3
2.	2012 වර්ෂයේ කාර්යය සාධනය	
2.1	සමාලෝචනය	4
2.2	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සඳහා මූල්‍යකරණය	4-8
2.3	ක්ෂුද්‍රමූල්‍ය	8-10
2.4	කුඩා පරිමාණ අංශය සඳහා සංවර්ධන සහායන්	10-12
2.5	ආහාර සුරක්ෂිතතාවය සඳහා ආරක්ෂණ තොග පවත්වා ගැනීම	12-13
2.6	පොහොර සහනාධාරය	13-16
2.7	සුළු හා මධ්‍ය පරිමාණ හා ක්ෂුද්‍රමූල්‍ය අංශ සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විදේශීය මූල්‍ය ව්‍යාපෘති	17-19
2.8	වෙනත්	19
3.	ආයතනික හා පරිපාලන කටයුතු	
3.1	කාර්යය මණ්ඩලය	20
3.2	සංවිධාන සැලැස්ම	21
3.3	කාර්යය මණ්ඩල තොරතුරු	22-23
3.4	දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ	24
3.5	විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ	25
4.	මූල්‍ය තොරතුරු	26

දැක්ම

" සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්, (ක්ෂුද්‍ර ව්‍යාවසායයන්, බැංකු අංශය සහ මූල්‍ය වෙළෙඳපොලවල් ද ඇතුළුව) නගා සිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ රජයේ ප්‍රධාන නියෝජිතයා ලෙස කටයුතු කරමින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම."

මෙහෙවර

" සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශය, ක්ෂුද්‍ර ව්‍යවසායය අංශය හා බැංකු අංශය සංවර්ධනය කිරීම වෙනුවෙන් අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම හා අදාල කොටස්කරුවන්ගේ මැදිහත්වීම තුළින් මූල්‍ය වෙළෙඳපොල වර්ධනය කිරීම."

දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- මූල්‍ය අංශය සංවර්ධනය කිරීම සහ රාජ්‍ය අනුග්‍රහය ලත් මූල්‍ය අනුග්‍රාහක යෝජනාවලීන් සඳහා සුදුසු ප්‍රතිපත්ති වැඩසටහන් සහ උපායමාර්ග සම්පාදනය කිරීම.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශවලට අදාල මූලික ගැටළු හඳුනාගැනීම සහ ඒ සඳහා විසඳුම් ලබාදීම.

- බැංකුකරණය, රක්ෂණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායය සහ ක්ෂුද්‍ර ව්‍යාවසායය සඳහා වන නීති සම්පාදනය සඳහා පහසුකම් සැපයීම.

- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, ඒ සඳහා අවශ්‍ය පසුවිපරම්/අධීක්ෂණ කටයුතු සිදු කිරීම සහ එම යෝජනා සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය වන පහසුකම් සැපයීම.

- කාලීන වශයෙන් දේශීය ආර්ථිකය තුළ ඇති වන ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

2. 2012 වර්ෂයේ කාර්යය සාධනය

2.1 සමාලෝචනය

අත්යන්ත්‍ර, රෙදිපිළි හා ඇඟළුම්, වැව්ලි හා වැව්ලි කර්මාන්ත, සංචාරක, කෘෂිකාර්මික, ආහාර හා පාන වර්ග නිෂ්පාදනය, ඉදි කිරීම්, වෙළෙඳ, ගබඩා, ප්‍රවාහනය හා අනෙකුත් සේවා යන අංශයන්හි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් විසින් සිදු කරන විශාල ප්‍රමාණයේ ක්‍රියාකාරකම් හඳුනා ගනිමින් මහින්ද චින්තන සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළින් මූර්ත ආර්ථික වර්ධනය ලඟා කර ගැනීම සඳහා රජය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායය අංශය වෙත ඉහළ ප්‍රමුඛත්වක් ලබා දී ඇත. නිෂ්පාදන අංශය තුළ රැකියා උත්පාදනයට සියයට 35 කින් ද, අපනයනය සඳහා සියයට 20 කින් ද, එකතු කළ වටිනාකම සඳහා සියයට 30 කින් ද, දායක වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 30 කින් පමණ දායක වේ. රටේ ආර්ථික සංවර්ධන සඳහා සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ ඇති විභවතාවය සැලකිල්ලට ගනිමින් එම අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීම, තරඟකාරිත්වය, නව්‍යතාවයන්, හා අගය එකතු කළ නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා රජය විසින් යටිතල පහසුකම්, මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම හා අඩු ආදායම් බදු අනුපාත සහිත බදු ක්‍රමයක් ඇතුළු දිරිගැන්වීම් රාශියක් ලබා දී ඇත. රජය විසින් හඳුන්වා දුන් සුළු හා මධ්‍ය පරිමාණ සඳහා හිතකර වු ප්‍රතිපත්ති රාමුව ප්‍රයෝජනයට ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් විශාල සංඛ්‍යාවක් අගය එකතු කළ නිෂ්පාදන ක්‍රියාදාමයන්ට මෙන්ම දේශීය හා ඉහළ ආර්ථිකයන් සහිත රටවල වෙළෙඳපොල වෙත ද අවතීර්ණ වී ඇත.

සංවර්ධන මූල්‍යයේ විශේෂිත ක්‍රියාමාර්ග

ප්‍රාථමික අංශය සංවර්ධන සඳහා මූල්‍යකරණය
- පොහොර සහනාධාර වැඩසටහන
- කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීම
- බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දීම
- බෝග හානි සඳහා ඇති අවධානම අවම කිරීම සඳහා කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දීම
- වී මිල දී ගැනීමේ වැඩසටහන

ක්ෂුද්‍රමූල්‍ය අංශයේ සංවර්ධනය සඳහා මැදිහත් වීම
- කල්බදු හා රක්ෂණ වැනි මූල්‍ය සේවා ලබා දීම දිරිගැන්වීම
- ව්‍යවසායකත්ව පුහුණු හා හැකියා වර්ධනය
- දිවිනැගුම/සමෘද්ධි වැඩසටහන් මඟින් ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයට අරමුදල් ගලා ඒම වැඩි කිරීම
- ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රය නියාමනය හා අධීක්ෂණය සඳහා ක්ෂුද්‍රමූල්‍ය පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායය අංශයේ සංවර්ධනය සඳහා උපායමාර්ගික මැදිහත් වීම
- මූල්‍යකරණය සඳහා ප්‍රවේශයන් ඉහළ නැංවීම
- වෙළෙඳපොල අවස්ථා වැඩි දියුණු කිරීම
- උප ගිවිසුම් සඳහා විධිවිධාන දියුණු කිරීම
- බදු පරිසරය වැඩි දියුණු කිරීම

2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සඳහා මූල්‍යකරණය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය ප්‍රවර්ධනය සඳහා බලපාන තීරණාත්මක සාධකය මූල්‍ය පහසුකම් සඳහා ඇති ප්‍රවේශය වන බැවින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය මූල්‍යකරණයට අදාළ කරුණු සැලකිල්ලට ගැනීම සඳහා වන ප්‍රතිපත්තිමය පියවර අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ. ඉහත සාධක සැලකිල්ලට ගනිමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු විසින් කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා අංශය දියුණු කිරීම සඳහා 2012 වසර තුළ රු. මිලියන 196,979

ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශයට ලබා දී ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඉහළ සහභාගිත්වය තහවුරු කරමින් 2012 වසර තුළ රාජ්‍ය බැංකුවලට සාපේක්ෂව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය ක්‍රියාකාරකම් සඳහා වැඩි ආයෝජනයක් කිරීමට පෞද්ගලික බැංකු උනන්දු වී ඇත.

වගුව 1 - රාජ්‍ය හා පෞද්ගලික බැංකු විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ලබා දුන් ණය - 2012

බැංකුව	කෘෂිකර්ම		කර්මාන්ත		සේවා		වෙනත්	
	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)
ලංකා බැංකුව	12	15.0	356	3,354.0	231	2,395.0	36	346.0
මහජන බැංකුව	3,247	6,869.9	1,607	10,393.7	1,795	4,135.5	1,227	3,643.4
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	385	195.0	590	490.0	170	85.0	280	590.0
ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව	42	101.3	241	1,120.6	39	243.2	31	113.5
සණස සංවර්ධන බැංකුව	22	152.0	42	581.0	9	139.0	61	625.0
ජාතික සංවර්ධන බැංකුව	370	1,725.8	1,098	3,346.7	380	1,132.9	2,817	5,748.3
ඩී.එෆ්.සී.සී. බැංකුව	487	1,445.5	2,953	13,053.6	1,017	5,981.1	-	-
කොමර්ෂල් බැංකුව	18,362	8,986.7	31,186	50,939.9	9,724	19,224.5	18,210	16,362.9
සම්පත් බැංකුව	163	895.0	1,828	7,746.3	215	1,074.3	191	1,633.4
හැටන් නැෂනල් බැංකුව	4,364	9,323.8	2,553	8,800.0	4,670	13,500.0	10,397	31,000.0
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව	132	679.2	537	1,129.9	2,453	3,806.1	8,876	10,929.4
යුනියන් බැංකුව	2,526	756.0	3,286	4,839.0	1,382	2,326.0	34,873	3,680.0
මුළු එකතුව	**30,112**	**31,145.1**	**46,277**	**105,794.6**	**22,085**	**54,042.6**	**76,999**	**74,671.9**

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

රූප සටහන 1 - විදේශ මූල්‍යනය සඳහා වූ එකඟතාවය 2006 - 2012



ආර්ථික සංවර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශයේ දායකත්වය සැලකිල්ලට ගනිමින්, මෑත කාලීනව රජය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සංවර්ධනය සඳහා විදේශීය අරමුදල් ද ලබා ගන්නා ලදී. වසර 2006 සිට 2011 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සුළු හා

මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශය සඳහා වන සමස්ත මූල්‍යමය බැඳීම් සියයට 6 කින් පමණ වර්ධනය වී ඇත.

ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

රජය විසින් 2012 වර්ෂය තුළ දී ද ණය දෙන ආයතන වෙත පොලී සහනාධාර ලබා දුන් අතර නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ තම අරමුදල් භාවිතා කරමින් ණය මුදල් ලබා දුන් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා පොලී සහනාධාර වශයෙන් රු. මිලියන 195.8 ක් ගෙවා ඇත. 2011 වසර සමග සැසඳීමේ දී 2012 වසර තුළ මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය සඳහා ඇති ඉල්ලුම සියයට 46 කින් පමණ ඉහළ ගොස් ඇත.

වගුව 2 - නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් වගා ණය 2011 - 2012

විස්තරය	2011	2012
නිකුත් කළ මුළු ණය ප්‍රමාණය (රු. මිලියන)	6,419.2	9,359.8
වගා කළ භූමි ප්‍රමාණය (අක්කර)	316,326.3	355,752.9
මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව	98,593	112,413
ගෙවන ලද මුළු සහනාධාර ප්‍රමාණය (රු. මිලියන)	205.2	195.8

මූලාශ්‍රයඃ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳ ප්‍රාදේශීය ව්‍යාප්තිය සලකා බැලීමේ දී අනිකුත් පළාත්වලට සාපේක්ෂව උතුරු පළාතෙන් වැඩිම ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර උතුරු මැද හා නැගෙනහිර පළාත් අනුපිළිවෙලින් දෙවන හා තුන්වන ස්ථානයට පත්ව ඇත. ලබා දුන් ණය ප්‍රමාණයේ ව්‍යාප්තිය සලකා බැලීමේ දී ණය සඳහා ප්‍රවේශ වීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් වීම සහ ප්‍රදේශයේ පැවති නව ආයෝජන දිරිමත් කෙරෙන සමකාමී පරිසරය වැනි සාධක නිසා නැගෙනහිර හා උතුරු පළාත තුළ සැලකිය යුතු වර්ධනයක් 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂය තුළ අත්පත් කරගෙන ඇත .

වගුව 3 - නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත වී ඇති ආකාරය, 2011 -2012

පළාත	ලබා දුන් ණය සංඛ්‍යාව			වටිනාකම (රු. මිලියන)		
	2011	2012	වර්ධනය %	2011	2012	වර්ධනය %
බස්නාහිර	14	0	-100.0	0.9	0.0	-100.0
මධ්‍යම	4,898	7,086	44.6	329.2	494.7	50.3
දකුණ	11,554	11,486	-0.5	586.2	674.1	14.9
උතුරු මැද	36,989	30,773	-16.8	1,799.9	1,732.1	-3.8
වයඹ	1,435	1,165	-18.8	63.9	58.6	-8.3
ඌව	5,632	8,105	43.9	330.7	483.6	46.2
සබරගමුව	569	503	-11.6	22.2	21.5	-3.1
නැගෙනහිර	9,758	16,686	70.9	591.1	1,243.2	110.3
උතුර	27,719	36,609	32.0	2,732.2	4,652.0	70.2
මුළු එකතුව	**98,568**	**112,413**	**43.7**	**6,456.3**	**9,359.8**	**176.7**

මූලාශ්‍රයඃ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

බෝග ව්‍යාප්තිය අනුව 2012 වර්ෂය තුළ වැඩිම ණය ප්‍රමාණයක් වී වගාවට ලබා දී ඇති අතර එය ප්‍රමාණාත්මකව දැක්වුවහොත් ප්‍රතිලාභීන් 73,488 ත් අතර රු. මිලියන 5,476.6 ක් බෙදා හැර ඇත. විදේශ විනිමය ගලා යෑම අවම කිරීම සඳහා ආනයන ආදේශන බෝග ලෙස ප්‍රවර්ධනය කළ බඩඉරිඟු හා ලොකුලූණු වගාවන්ට අනුපිළිවෙලින් වී වගාවට පසුව වැඩිම ණය ප්‍රමාණයක් ලබා දී ඇත.

වගුව 4 - බෝග අනුව ලබා දුන් ණය ප්‍රමාණය, 2012

බෝගය	ණය සංඛ්‍යාව	ණය ප්‍රමාණය (රු. මිලියන)	භූමි ප්‍රමාණය (අක්කර)
මිරිස්	2,494	150.5	4,116.7
බඩඉරිඟු	8,489	389.3	21,240.4
ලොකුලූණු	17,334	2,241.8	31,418.7
වී	73,488	5,472.6	281,663.4

අර්තාපල්	4,198	558.5	5,165.9
එළවළු	5,290	485.4	8,032.5
වෙනත්	1,120	61.7	4,115.2
මුළු එකතුව	**112,413**	**9,359.8**	**355,752.9**

මූලාශ්‍රයः ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා ආනයන ආදේශන බෝග ලෙස ප්‍රවර්ධනය කළ වාණිජ බෝග වගා කිරීම සඳහා ගොවීන් තවදුරටත් පෙළඹ වීම මෙම සහනදායී ණය යෝජනා ක්‍රමය තුළින් සිදුවේ. ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සංඛ්‍යාවෙන් සියයට 30 ක් හා වටිනාකමින් සියයට 35 බඩඉරිඟු, ලොකුලූණු, අර්තාපල් හා මිරිස් වැනි ආනයන ආදේශන වාණිජ බෝග වගා කළ ගොවීන් විසින් ලබා ගෙන ඇති බව 2012 වර්ෂය තුළ ලඟා කර ගත් ප්‍රගතිය විශ්ලේෂණය කිරීමේ දී පෙනී යයි. මේ අතරින් බඩඉරිඟු හා සෝයා බෝංචි වැනි සමහර වාණිජ බෝග ස්වයංපෝෂිත මට්ටමට ලඟා වීමට ඉතා ආසන්නව ඇති අතර එම බෝග අපනයනය කිරීමේ හැකියාවක් ද පවතී.

කෘෂි හා පශුසම්පත් සංවර්ධනය

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ අරමුණින් කුඩා පරිමාණ කිරි ගොවීන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබා දීමට මෙම ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. 2011 වර්ෂයේ පෙබරවාරි මස දී අවසන් වන, වසර තුනක කාල පරිච්ඡේදයක් තුළ රු. මිලියන 5,000 ක් කිරි ගොවීන් සඳහා ලබා දීමේ මූලික අරමුණින් මෙම ණය යෝජනා ක්‍රමය 2008 වසරේ මාර්තු මස ආරම්භ කරන ලදී. එසේ වුවද, ව්‍යාපෘති කාලය 2012 ජූනි මස 30 දක්වා දීර්ඝ කරන ලදී.

වගුව 5 - කෘෂි හා පශුසම්පත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය 2008 - 2012

ප්‍රතිලාභීන්	ණය සංඛ්‍යාව	ප්‍රතිශතය	ණය ප්‍රමාණය (රු. මිලියන)	ප්‍රතිශතය
ණය ලබා ගත් සුළු පරිමාණ ගොවීන්	13,282	93.5	1,573.1	65.9
පෞද්ගලික අංශයේ ආයෝජකයින්	911	6.5	813.7	34.1
මුළු එකතුව	**14,193**	**100**	**2,386.8**	**100**

මූලාශ්‍රයः ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 93 කටත් වඩා වැඩි ප්‍රමාණයක් සුළු පරිමාණ කිරි ගොවීන් විසින් ලබා ගෙන ඇති බැවින් මෙම ණය යෝජනා ක්‍රමයේ වැඩි ප්‍රතිලාභ සුළු පරිමාණ කිරි ගොවීන්ට ලැබී ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ වාණිජ බැංකු 11 ක් සහභාගීත්ව මූල්‍ය ආයතන වශයෙන් නම් කරන ලද අතර රජය විසින් දළ වශයෙන් රු. මිලියන 156 ක් පොලී සහනාධාර වශයෙන් 2012 වසර අවසන් වන විට එම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගෙවා ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයකයින් සඳහා විශේෂිත වූ බැංකු ශාඛා

2012 අයවැය යෝජනා මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයකයින්ට විශේෂිත වූ බැංකු ශාඛා දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කිරීමට බැංකු පද්ධතිය උනන්දු කරවන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට විශේෂිත වූ බැංකු ශාඛා ස්ථාපිත කිරීම කෙරෙහි සියළුම වාණිජ බැංකු දිරිමත් කිරීම සඳහා එම බැංකු ශාඛා සඳහා විශේෂිත වූ දිරිදීමනා රජය විසින් ලබා දෙන ලදී. මෙම යෝජනාව අනුව වාණිජ බැංකු විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය සහාය ලබා දීම සඳහා නවීන තාක්ෂණික උපකරණවලින් සමන්විත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට විශේෂිත වූ බැංකු ශාඛා දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය උපදේශාත්මක සේවා හා මූල්‍ය පහසුකම් ලබා දීමට කැප වූ සේවක පිරිසක් යටතේ මෙම බැංකු ශාඛා මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වේ.

වගුව 6 - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා විශේෂිත වූ බැංකු ශාඛාවල ප්‍රගතිය

බැංකුව	කෘෂිකර්ම		කර්මාන්ත		සේවා		වෙනත්	
	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)
ලංකා බැංකුව	27	241.20	341	3,263.14	231	2,332.35	36	263.47
මහජන බැංකුව	19	50.50	137	603.45	55	389.38	54	163.01
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	6	6.70	8	10.40	17	27.60	0	0.00
මුළු එකතුව	**52**	**298.40**	**486**	**3,876.99**	**303**	**2,749.33**	**90**	**462.48**

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

ආයෝජන අරමුදල් ගිණුම

2011 වසරේ දී බැංකුවල ලාභය මත අය කරන ආදායම් බදු හා එකතු කළ වටිනාකම් මත පනවන බද්ද සංශෝධනය කිරීම තුළින් ඇති වන ඉතිරි කිරීම් යොදා ගනිමින් පිහිටුවන ලද ආයෝජන අරමුදල් ගිණුම රට තුළ ප්‍රමාණවත් සැපයුමක් නොමැති දිගු කාලීන මූල්‍ය පහසුකම් සැපයීම තුළින් රටේ සංවර්ධන ක්‍රියාවලියට ඉහළ දායකත්වයක් ලබා දී ඇත. මෙම ආයෝජන අරමුදල් ගිණුම ස්ථාපිත කිරීම මඟින් ඉදිකිරීම් කර්මාන්තයේ නියැලි දේශීය කොන්ත්‍රාත්කරුවන් විවිධ ඉදිකිරීම් ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට දිරිමත් කර ඇත. ඒ අනුව, කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ඩී.එෆ්.සී.සී. බැංකුව හා මහජන බැංකුව විසින් තරඟකාරී පොලී අනුපාතයන්ට තම ආයෝජන අරමුදල් ගිණුම් හරහා ලබා දුන් රු. බිලියන 46 ක් පමණ වූ මූල්‍ය පහසුකම් භාවිත කරමින් කි.මීටර් 575.62 කින් යුත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 18 ක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. අනෙකුත් ක්ෂේත්‍රයන් සඳහා ද අවශ්‍ය අරමුදල් ආයෝජන අරමුදල් ගිණුම හරහා සැපයීමට බැංකු විසින් ඔවුන්ගේ මධ්‍යකාලීන ව්‍යාපෘති කළඹ ක්‍රමානුකූලව වර්ධනය කරගෙන ඇත.



රූප සටහන 2 - ආයෝජන අරමුදල් ගිණුම හරහා දේශීය බැංකු විසින් සපයා ඇති ණය පහසුකම්

2.3 ක්ෂුද්‍රමූල්‍ය

බැංකු ඇපකර හා අනෙකුත් අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට ඇති නොහැකියාව මත විධිමත් බැංකු පද්ධතියට හා මූල්‍ය ආයතනවලට සෘජුවම ප්‍රවේශවීමට අපහසුතාවය ඇති අවිධිමත් අංශයේ සුළු ව්‍යවසායකයන් ද ඇතුළුව අඩු ආදායම්ලාභී ග්‍රාමීය හා නාගරික ජනතාවගේ මූල්‍යමය අවශ්‍යතාවන් සපුරාලීමේ ඵලදායි මෙවලමක් ලෙස ක්ෂුද්‍රමූල්‍ය හඳුනාගෙන ඇත. රටේ කුඩා ආර්ථිකයන්හි වර්ධනය සඳහා ක්ෂුද්‍රමූල්‍ය අංශයේ හැකියාව තිරසාර කිරීම සඳහා පහසුකම් සැපයීමේ වැදගත්කම හඳුනා ගත් රජය ක්ෂුද්‍ර ව්‍යවසායකයන් මෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය සංවර්ධනය කිරීම තුළින් ඔවුන් ප්‍රධාන ආර්ථික ප්‍රවාහයට ප්‍රවේශ වීම සඳහා

අවස්ථාව සැලසීමට රජය විවිධ මූල්‍යමය පහසුකම් ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇත. 2012 වසරේ දී ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන්වල ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

වගුව 7 - ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ප්‍රගතිය - 2012

ක්ෂුද්‍රමූල්‍ය ආයතනය	මුළු තැන්පතු ප්‍රමාණය (රු. මිලියන)	මුළු ණය ලබා ගැනීම් (රු. මිලියන)	මුළු වත්කම් (රු. මිලියන)	මුළු ආයෝජන (රු. මිලියන)	ලබා දුන් ණය ප්‍රමාණය (රු. මිලියන)
සමෘද්ධි සංගම්/බැංකු	42,233	87,046	47,323	42,098	84,251
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව	76,378	29,395	67,585	20,100	43,350
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	237	184	1,042	359	4,715
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	54,710	6,078	69,134	11,385	105,870
සණස සංවර්ධන බැංකුව	18,003	10,337	24,834	3,430	17,919
මුළු එකතුව	**191,561**	**133,040**	**209,918**	**77,372**	**256,105**

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

ඒ අනුව, ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ප්‍රදානය කර, 2012 වසර අග වන විට අය විය යුතු මුළු ණය ප්‍රමාණය රු. බිලියන 256 කි. එම ප්‍රමාණයෙන් රු. බිලියන 106 ක් ප්‍රාදේශීය සංර්ධන බැංකුවට අය විය යුතු ණය වන අතර සමෘද්ධි බැංකු සංගම් මගින් ලබා දී අය වීමට ඇති ණය ප්‍රමාණය රු. බිලියන 84 කි. වාණිජ බැංකු ද ක්ෂුද්‍රමූල්‍ය කාර්යයන් සඳහා පහසුකම් සපයන්නකු වශයෙන් සුවිශේෂ කාර්යයභාරයක් ඉටු කරන අතර 2012 වසරේ දී ක්ෂුද්‍රමූල්‍ය අංශයට ලබා දී ඇති ණය ප්‍රමාණයන් පහත දැක්වේ.

වගුව 8 - ප්‍රධාන බැංකු විසින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ලබා දී ඇති ණය - 2012

බැංකුව	නිකුත් කළ ණය ප්‍රමාණය				
	රු. මිලියන 2 අඩු	රු. මිලියන 2-5 අතර	රු. මිලියන 5-10 අතර	රු. මිලියන 10 වැඩි	මුළු ණය (රු. මිලියන)
ලංකා බැංකුව	41,493	3,381	143	414	45,431
මහජන බැංකුව	2,791	798	494	450	4,534
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	7,748	-	-	-	7,748
ජාතික සංවර්ධන බැංකුව	29	-	-	-	29
සණස සංවර්ධන බැංකුව	16,461	-	-	-	16,461
කොමාර්ෂල් බැංකුව	1,602	-	-	-	1,602
සම්පත් බැංකුව	74	3	10	-	87
හැටන් නැෂනල් බැංකුව	9,106	2,643	1,889	2ල745	16,383
මුළු එකතුව	**79,304**	**6,825**	**2,536**	**3,609**	**92,275**

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

2012 වසරේ දී ප්‍රධාන බැංකු විසින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රු. බිලියන 92 ක් පමණ වන අතර ඉන් රු. බිලියන 45 ක් ලංකා බැංකුව විසින් විවිධ ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇත. මෙම ක්ෂේත්‍රය තුළ සැලකිය යුතු කාර්යයභාරයක් ඉටු කරන සණස සංවර්ධන බැංකුව ද ක්ෂුද්‍රමූල්‍ය අංශය සඳහා රු. බිලියන 16 ක ණය 2012 වසර තුළ ලබා දී ඇත. අනෙකුත් වාණිජ බැංකු අතරින් ක්ෂුද්‍රමූල්‍ය ක්‍රියාකාරකම්වලට ඉහළ දායකත්වයක් ලබා දෙන හැටන් නැෂනල් බැංකුව සියළුම ණය පරාසයන් ආවරණය වන පරිදි සැලකිය යුතු ණය ප්‍රමාණයක් ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයට ලබා දී ඇත.

උකස් වෙළෙඳපොල

ණය සඳහා අවශ්‍ය සුරැකුම් පිළිබඳ ගැටළු පැවතීම නිසා සාම්ප්‍රදායික බැංකුවලට තවමත් අඩු ආදායම්ලාභී ජනතාවට ප්‍රමාණවත් ණය පහසුකම් සැලසීමට නොහැකි වීම හේතුවෙන් උකස් ණය සමාජයේ සියළුම අංශයන් අතර වඩාත් ජනප්‍රිය ණය ලබා ගැනීමේ ක්‍රමයක් බවට පත් වී ඇත. ඉලක්කගත කණ්ඩායම්වල මූලික හා හදිසි අවශ්‍යතාවන්, සහ බලාපොරොත්තු ඉටුකිරීම අරමුණු කර ගනිමින් මෙම ණය වැඩසටහන් සකසා ඇති බැවින් උකස් ණය ග්‍රාමීය අංශයේ වඩා ජනප්‍රිය ණය ක්‍රමය බවට පත් වී ඇත. මෙම ණය පහසුකම් සාමාන්‍ය බැංකු ණය පහසුකම්වලට

වඩා වෙනස් වන අතර කෙටි කාල පරාසයක් තුළ කුඩා ණය වැඩි ප්‍රමාණයක් ප්‍රදානය කළ හැකි වේ. 2012 වසරේ උකස් ණය පිළිබඳ ප්‍රගතිය පහත දැක්වේ.

වගුව 9 - උකස් ණය 2007 - 2012

බැංකුව	ණය ප්‍රමාණය (රු. මිලියන)					
	2007	2008	2009	2010	2011	2012
කොමර්ෂල් බැංකුව	-	12.80	539.60	3,757.60	23,928.40	26,043.54
ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකුව	27.00	206.80	339.50	962.80	4,361.00	3,403.56
හැටන් නැෂනල් බැංකුව	16,780.00	21,130.00	21,920.00	27,970.00	35,720.00	62,850.00
මහජන බැංකුව	76,143.60	96,313.50	125,120.30	189,797.20	291,325.70	317,135.85
සම්පත් බැංකුව	11,962.00	16,444.00	24,817.00	43,306.00	64,009.00	61,107.44
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	46,729.50	53,883.00	58,234.10	66,189.20	75,917.70	33,858.55
ලංකා බැංකුව	24,670.00	37,783.90	55,278.00	93,796.20	188,481.10	640,968.84
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	10,758.30	14,607.10	24,572.00	36,217.00	57,822.60	72,806.30
සෙලාන් බැංකුව	1,577.00	4,990.40	7,219.00	17,601.00	30,623.20	36,296.25
මුළු එකතුව	**188,647.40**	**245,371.50**	**318,039.50**	**479,597.70**	**772,188.70**	**1,254,470.33**
ලබා දෙන ලද මුළු ණය ප්‍රමාණය	**5,095,518**	**5,900,434**	**6,673,524**	**7,608,067**	**9,027,369**	**13,139,894**
පොලී අනුපාතය	**19-24%**	**18-24%**	**14-23%**	**10-14%**	**10-14%**	**17-21**
සාමාන්‍ය ණය ප්‍රමාණය	**37,729**	**42,301**	**47,682**	**63,899**	**85,538**	**95,470**
වර්ධන අනුපාතය	**-**	**30%**	**30%**	**53%**	**60%**	**61%**

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

පසුගිය වසර 6 ක කාලය තුළ උකස් ණය සියයට 47 ක සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගයකින් වැඩි වී ඇත. උකස් ණය පොලී අනුපාතිකය වෙළෙඳපොල සාධක මත තීරණය වන අතර එය සියයට 14 - 20 ත් අතර පරාසයක් තුළ උච්චාවචනය වේ. සියළුම බැංකුවල උකස් ණය ප්‍රමාණය සාමාන්‍යයෙන් ඉහළ මට්ටමක පවතින අතර 2012 වසර තුළ රු. බිලයන 1,254 කට අධික ණය ප්‍රමාණයක් ගණුදෙනුකරුවන් 13,139,894 දෙනෙකුට ලබා දී ඇත. 2007 වසරේ දී රු. 37,729 ක් වූ උකස් ණයක සාමාන්‍ය අගය 2012 වසර වන විට රු. 95,470 දක්වා දෙගුණයට වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වී ඇත.

ක්ෂුද්‍රමූල්‍ය ආයතන අතර සිදු වන ක්‍රියාකාරකම් අධීක්ෂණය හා නියාමනය කිරීම සඳහා ආයතනික යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණ මූලික කර ගනිමින් ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයේ නියාමකයා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට කටයුතු කිරීමට හැකි වන පරිදි මූල්‍ය මණ්ඩලය හරහා අධීක්ෂණ හා නියාමන ක්‍රමවේදයක් හඳුන්වා දීමට ක්ෂුද්‍රමූල්‍ය පනත කෙටුම්පත් කරන ලදී.

2.4 කුඩා පරිමාණ අංශය සඳහා සංවර්ධන සහායන්

රජය විසින් වී, බඩඉරිඟු, සෝයා බෝංචි, ලොකුලූණු, අර්තාපල් සහ කිරි වැනි කෘෂි නිෂ්පාදන සඳහා නිෂ්පාදකයාට ආකර්ෂණීය ස්ථාවර මිලක් සහතික කිරීම වැනි පුළුල් පරාසයක් තුළ විහිදුනු පහසුකම් සුළු පරිමාණ නිෂ්පාදකයාට ලබා දීම තුළින් කෘෂි ඵලදායිතාවය ඉහළ දැමීමට පොළඹ වන ලදී.

වගුව 10 - තෝරා ගත් බෝග කිහිපයක් සඳහා ගොවිපලේ දී ගොවියාට ලැබෙන මිල 2008 - 2012

බෝග	ගොවි බිමේ දී නිෂ්පාදකයාට ලැබෙන මිල (කි.ග්‍රෑමයට රුපියල්)						
	2006	2007	2008	2009	2010	2011	2012
වී	13-14	15-18	20-22	28-30	28-30	28-30	32-35
වියළි මිරිස්	130	162	163-194	173-193	161-187	214-228	162-201
බඩඉරිඟු	17-20	20-25	27-36	28-36	29-38	34-46	35-43
බීළූණු	33-46	40-50	33-62	30-89	43-151	55-175	46-101
අර්තාපල්	52-57	55-58	52-67	55-85	50-81	64-88	64-103
දියර කිරි (ලීටර් 750)	22.72	23.97	30.83	31.20	34.80	50.00	50.00

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

වී අලෙවි මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරු හා සමුපකාර සමිති හරහා රජය වී මිල දී ගැනීමට මැදිහත් වීම තුළින් වී මිල උච්චාවචනය වීම සාර්ථකව කළමනාකරණය කිරීමටත් 2012 වර්ෂය තුළ වී ගොවියා සඳහා ස්ථාවර මිලක් ලබා දීමටත් රජය සමත් වී ඇත. රූප සටහන 3 හි දැක්වෙන පරිදි රජය විසින් වී සහ සහල් සඳහා පනවන ලද සහතික මිල ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස 2008 යල කන්නයේ සිට ගොවියාට තම වී නිෂ්පාදනය සඳහා ස්ථාවර මිලක් ද පාරිභෝගිකයාට සහල් සඳහා ස්ථාවර සිල්ලර මිලක් ද ලැබී ඇත.

රූප සටහන 3 - සම්බා හා නාඩු සහල් සහ වී සඳහා වාර්ෂික සාමාන්‍ය මිල, 2000 - 2012



වී මිල දී ගැනීමේ වැඩසටහනෙහි සංධිස්ථානයක් වනුයේ වී ගොවීන් සඳහා වාසිදායක වාතාවරණයක් ඇති කරමින් වී සඳහා සහතික මිලක් ස්ථාපිත කිරීම වේ. පසුගිය වසර හත තුළ සහතික මිලෙහි වැඩි වීම වගු අංක 11 හි දක්වා ඇත. පසුගිය වසර හතක කාලය තුළ වී සඳහා වන සහතික මිල දෙගුණය ඉක්මවමින් වැඩි වී ඇති අතර 2012 වසර තුළ වී සඳහා වන සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය කි.ග්‍රෑම් එකකට රු. 16.50 ක් පමණ මට්ටමක පැවතිණ. වී සඳහා ස්ථාවර වෙළෙඳපොලක් සහතික කිරීම සඳහා රජය විසින් 2013 අයවැය යෝජනා මගින් 2012/13 මහ කන්නයේ සිට නාඩු වී කි.ග්‍රෑමයක් සඳහා වන සහතික මිල රු. 32 දක්වා ද සම්බා වී කි.ග්‍රෑමයක් සඳහා වන සහතික මිල රු. 35 ක් දක්වා ද ඉහළ දමන ලදී. ඒ සමගම කාබනික පොහොර භාවිතා කර නිෂ්පාදනය කරනු ලබන වී කි.ග්‍රෑමයක සහතික මිල රු. 40 ලෙස හඳුන්වා දෙන ලදී.

වගුව 11 - වී සඳහා වන සහතික මිල 2006 - 2013

කාල සීමාව	සහතික මිල (රු./කි.ග්‍රෑම්)
2005/06 මහ	15.50 – 16.50
2006 යල	15.50 – 16.50
2006/07 මහ	16.50 – 17.50
2007 යල	16.50 – 17.50
2007/08 මහ	20.00 – 22.00
2008 යල සිට 2012 යල දක්වා	28.00 – 30.00
2012/13 මහ	32.00 – 35.00

මූලාශ්‍රය: වී අලෙවි මණ්ඩලය

වී මිල දී ගැනීමේ වැඩසටහනට අමතරව ත්‍රිපෝෂ වැඩසටහන හරහා සෝයා බෝංචි හා බඩඉරිඟු මිල දී ගැනීමට රජය විසින් පහසුකම් සලසන ලදී. සකස් කරන ලද බඩඉරිඟු කි.ග්‍රෑමයක් රු. 45 කට සැපයුම්කරුවන්ගෙන් මිල දී ගත් අතර ගොවීන් සඳහා කි.ග්‍රෑමයකට රු. 32 ක් ගෙවන ලදී. ත්‍රිපෝෂ වැඩසටහන සඳහා වන සමස්ත සෝයා බෝංචි අවශ්‍යතාවය දේශීය සැපයුම්කරුවන්ගෙන් සපුරා ගන්නා ලදී. ඒ අනුව සැපයුම්කරුවන් විසින් කි.ග්‍රෑමයක් සඳහා රු. 85 ක් සෝයා බෝංචි ගොවියා වෙත ගෙවන ලද අතර ත්‍රිපෝෂ සමාගම කි.ග්‍රෑමයක් රු. 95 බැගින් සැපයුම්කරුවන් මගින් මිල දී ගන්නා ලදී. සෝයා බෝංචි සැපයුම අඩු වීම හේතුවෙන් රු. 105 බැගින් ගොවීන්ගෙන් මිල දී ගත් සෝයා බෝංචි කි.ග්‍රෑමයක් රු. 115 බැගින් සැපයුම්කරුවන් විසින් ත්‍රිපෝෂ ආයතනය වෙත අලෙවි කරන ලදී.

මිල්කෝ ආයතනය හරහා රජය විසින් දියර කිරි වෙළෙඳපොලට සාර්ථකව මැදිහත්වී කිරි ගොවීන් සඳහා දියර කිරි ලීටරයක රු. 50 ක සහතික මිලක් ලබා දෙන ලදී. දේශීය දියර කිරි කර්මාන්තය ස්වයංපෝෂිත මට්ටමට ගෙන ඒම සඳහා රු. මිලියන 160 ක් දියර කිරි මිල දී ගැනීමට මිල්කෝ ආයතනයට 2012 වර්ෂයේ දී ලබා දී ඇත. ඉහළ ඵලදාවක් සහිත රෝපණ ද්‍රව්‍ය ලබා දීම, මනා ජල කළමනාකරණය, ප්‍රවාහනයේ දී වන අපතේ යාම අඩු කිරීම, හා පරිසරය සංරක්ෂණය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග නිසා මෙම සංවර්ධන සහනාධාරවල ධනාත්මක බලපෑම තවදුරටත් වර්ධනය වී ඇත.

2.5 ආහාර සුරක්ෂිතතාවය සඳහා ආරක්ෂණ තොග පවත්වා ගැනීම

ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ආරක්ෂිත වී තොගයක් පවත්වා ගෙන යාමේ වගකීම වී අලෙවි මණ්ඩලය වෙත පවරා ඇත. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2012 වසර තුළ රු. මිලියන 3,553.35 ක් වැය කරමින් මෙ.ටො. 126,262 ක වී තොගයක් වී අලෙවි මණ්ඩලය විසින් මිල දී ගත් අතර එය රටෙහි සමස්ත පාරිභෝජනය අවශ්‍යතාවයෙන් සති 3 කාලයක් සඳහා ප්‍රමාණවත් වේ.

වගුව 12 - වී අලෙවි මණ්ඩලය මඟින් මිල දී ගන්නා ලද වී තොග - 2012.12.31 දිනට

කන්නය	වී තොග			වටිනාකම (රු. මිලියන)
	නාඩු (මෙ.ටො.)	සම්බා (මෙ.ටො.)	එකතුව (මෙ.ටො.)	
2010 යල	83,819	27,910	111,729	83,819
2010/11 මහ	2,913	556	3,469	2,913
2011 යල	58,967	16,205	75,172	58,967
2011/12 මහ	107,319	8,467	115,786	107,319
2012 මහ	9,936	540	10,476	9,936

මූලාශ්‍රයඃ වී අලෙවි මණ්ඩලය

තවද, දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් සමුපකාර සමිති හරහා රු. මිලියන 1,096.61 ක් වැය කරමින් මෙ.ටො. 37,497.28 ක වී තොගයක් 2012 වසර තුළ දී මිල දී ගෙන ඇත. වී අලෙවි මණ්ඩලය හා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් මෙම වී තොගවලින් සියයට 92 කට වැඩි ප්‍රමාණයක් 2011/12 මහ කන්නය තුළ දී මිලට ගෙන ඇත.

වගුව 13 - වී මිල දී ගැනීමේ වැඩසටහන සඳහා මූල්‍යකරණය (රු. මිලියන)

මූලාශ්‍රය	වී අලෙවි මණ්ඩලය		දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන් වෙත ලබා දුන් අත්තිකාරම් සීමාවන්
	ඔඩපණ ණයවල උපරිම ණය සීමාව/අත්තිකාරම්	2012.12.31 දිනට ලබා දුන් ණය/ අත්තිකාරම්	
ලංකා බැංකුව	3,100	3,100.0	-
මහජන බැංකුව	2,100	1,668.9	-
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	450	250.0	-
ජාතික ඉතිරි කිරීමේ බැංකුව*	1,000	725.9	-
භාණ්ඩාගාර අත්තිකාරම්	2,000	2,000.0	1,340.0
වෙනත්	-	1,155.0	-
මුළු එකතුව	**8,650**	**8,899.0**	**1,340.0**

මූලාශ්‍රයඃ සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය, රාජ්‍ය බැංකු
** සාමාන්‍ය ණය පහසුකමකි.*

සහලින් නිෂ්පාදනය ස්වයංපෝෂිත මට්ටමකට ලඟා කර ගන්නා අතර ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට ප්‍රමාණවත් සහල් තොග පවත්වාගෙන යාමට අවශ්‍ය ධාරිතාව වර්ධනය කරමින් රජය ආනයන ආදේශන ඉලක්කයන් අභිබවා සහල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට මැදිහත් විය. ඒ අනුව, වී අලෙවි මණ්ඩලය සහල් මෙ.ටො. 22,950 ක් අපනයනය කළ අතර ලෝක ආහාර වැඩසටහන සමඟ සම්බන්ධ වෙමින් සහල් මෙ.ටො. 6,987 ක් සෝමාලියා රාජ්‍ය වෙත පරිත්‍යාග කරන ලදී.

සෝමාලියා රාජ්‍ය වෙත සහල් පරිත්‍යාග කිරීම - 2012

වී මිල දී ගැනීම සඳහා පෞද්ගලික අංශය දක්වන දායකත්වය සැලකිය යුතු මට්ටමක පවතී. වාර්ෂික වී නිෂ්පාදනයෙන් සියයට 65 ක් පමණ පෞද්ගලික අංශය විසින් මිල දී ගන්නා අතර ඒ වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු විසින් 2012 වසරේ ලබා දුන් ඔඩපණ ණය ප්‍රමාණය රු. මිලියන 10,024 කී. මුළු ඔඩපණ ණය ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක්, එනම් සියයට 73.5 ක් රාජ්‍ය බැංකු විසින් පෞද්ගලික අංශයේ වී මිල දී ගන්නන් වෙත ලබා දී ඇති අතර ඉන් විශාල ප්‍රමාණයක් සුළු හා මධ්‍ය පරිමාණ වී මිල දී ගන්නන් වේ.

වගුව 14 - වී මිල දී ගැනීම සඳහා පෞද්ගලික අංශයට ලබා දුන් ඔඩපණ ණය - 2012

බැංකුව	2011/12 මහ		2012 යල		එකතුව	
	ණය ප්‍රමාණය	වටිනාකම (රු. මිලියන)	ණය ප්‍රමාණය	වටිනාකම (රු. මිලියන)	ණය ප්‍රමාණය	වටිනාකම (රු. මිලියන)
මහජන බැංකුව	120	1,010.6	90	512.3	210	1,522.9
ලංකා බැංකුව	69	3,386.0	33	2,306.0	102	5,692.0
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	41	61.1	42	88.3	83	149.4
එකතුව - රාජ්‍ය බැංකු	**230**	**4,457.7**	**165**	**2,906.6**	**395**	**7,364.3**
කොමර්ෂල් බැංකුව	64	404.9	11	43.5	75	448.4
හැටන් නැෂනල් බැංකුව	87	690.5	92	849.7	179	1,540.2
සෙලාන් බැංකුව	33	150.0	31	198.1	64	348.1
සම්පත් බැංකුව	75	323.0	-	-	75	323.0
එකතුව - පෞද්ගලික බැංකු	**259**	**1,568.4**	**134**	**1,091.3**	**393**	**2,659.7**
මුළු එකතුව	**489**	**6,026.1**	**299**	**3,997.9**	**788**	**10,024.0**

මූලාශ්‍රයඃ අදාළ බැංකුවලින් ලබා ගත් තොරතුරු මත සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

2.6 පොහොර සහනාධාරය

වී වගාව සඳහා පොහොර සහනාධාරය

කෘෂි කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා සහනාධාර ලබා දීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, නියමිත ප්‍රමාණයට පොහොර යෙදීම හා භාවිතය පිළිබඳව රජය විසින් නිරන්තර අවධානය යොමු කර ඇත. රසායනික පොහොර මිල අධික වීම, වී වගාවට බලපාන ප්‍රධාන බාධකයක්ව පැවති හෙයින් 2005 දී රජය වී පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර 2012 දක්වා වසර හතක් මුළුල්ලේ අඛණ්ඩව සහනාධාර ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව, වී වගාව සඳහා ලබා දෙන ප්‍රධාන පොහොර වර්ග වූ යූරියා, ටී.එස්.පී. හා එම්.ඕ.පී. කි.ග්‍රෑම් 50 ක බෑගයක් රු. 350 ක සහනාධාර මුදලකට දිවයිනේ සෑම පළාතකම ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා බෙදා දෙන ලදී.

වී වගාව සඳහා ලබා දෙන කි.ග්‍රෑම් 50 ක පොහොර බෑගයක් වෙනුවෙන් රජය විසින් දරා ඇති සහනාධාරය වෙළෙඳපොළ මිලෙන් සියයට 86.5 සිට සියයට 91.5 දක්වා පරාසයක වන අතර කි.ග්‍රෑම් 50 ක පොහොර බෑගයක් සඳහා රජය විසින් දරණ ලද සහනාධාර පිරිවැය පසුගිය වසර කිහිපය මුළුල්ලේ වර්ධනය වී ඇත.

රූප සටහන 4 - කි.ග්‍රෑම් 50 ක වී පොහොර බෑගයක් සඳහා රජය දරා ඇති සහනාධාර පිරිවැය සැසඳීම, 2010 - 2012



වී වගාවේ ඵලදායීතාවය වී පොහොර සහනාධාරය මත වර්ධනය වී ඇති ආකාරය රූප සටහන 4 න් නිරීක්ෂණය වේ. එසේ වුවද, හිතකර හා අහිතකර කාලගුණික තත්ත්වයන් වී වගාව සඳහා සෘජුවම බලපානු ලබන අතර වී වගාව සඳහා ලබා දෙන පොහොර සහනාධාරය, බීජ සහ ණය පහසුකම් සැපයීම මඟින් අපේක්ෂිත දායකත්වය සඳහා ද නිරන්තරයෙන් සෘණාත්මක බලපෑමක් ඇති කරයි. ඉහත තත්ත්වය හේතුවෙන් වී වගාවෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වාරිමාර්ග හා ජල කළමනාකරණය, පසේ සාරවත් භාවය ඉහළ දැමීම හා පාංශු ඛාදනය අවම කිරීම සඳහා උනන්දුව, ඉහළ ඵලදාවයෙන් යුතු බීජ වැඩි දියුණු කිරීම හා රෝපණ ද්‍රව්‍ය හා යෝග්‍ය ඉඩම් භාවිතා කිරීම සැලසුම් කිරීම තවදුරටත් වර්ධනය කිරීමට රජය කටයුතු කරන ලදී.

වගුව 15 - වී වගාව සඳහා වන නිර්ණායකයන්හි වෙනස් වීම - මහ කන්නය

විස්තරය	1999/00 (පොහොර සහනාධාරය දීමට පෙර)	2005/06 (පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ආරම්භක අවධිය)	2011/12 (පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක වී වසර 6 කට පසු)	වර්ධනය (%)	
				1999/00 සිට 2011/12 දක්වා	2005/06 සිට 2011/12 දක්වා
වී නිෂ්පාදනය (මෙ.ටො.)	1,781,000	2,135,592	2,716,961	34.45	21,40
වගා කරන ලද මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)	549,000	591,295	702,075	21,80	15,78
අස්වනු නෙලන ලද මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)	526,000	585,903	684,636	23,17	14,42
ඵලදායීතාව (හෙක්ටයාරයකට කි.ග්‍රෑම්)	3,798	4,069	4,444	14,54	8,44

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වගා කන්න 14 ක් අඛණ්ඩව වී ගොවීන් හට පොහොර සහනාධාරය ලබා දීම හා සහනාධාර පොහොර මිල රු. 350 ක මට්ටමක පවත්වා ගෙන යාම මඟින් වී නිෂ්පාදනය සඳහා දායක වී ඇති මුළු ගොවීන් සංඛ්‍යාව හා පොහොර භාවිතය වැඩි වී ඇත.

වගුව 16 - වී පොහොර සහනාධාර වැඩසටහන යටතේ වාර්ෂිකව පොහොර බෙදා දීම 2006 - 2012

වර්ෂය	යල මහ කන්න 2 යටතේ පොහොර ලබා ගෙන ඇති මුළු ගොවීන් සංඛ්‍යාව	බෙදා දී ඇති පොහොර ප්‍රමාණය (මෙ.ටො.)				රජය විසින් පොහොර සහනාධාරය සඳහා දරා ඇති මුළු වියදම (රු. මිලියන)
		යූරියා	ටී.එස්.පී.	එම්.ඕ.පී.	එකතුව	
2006	1,099,983	120,509	27,347	30,753	178,609	3,970
2007	1,366,234	200,224	64,380	60,481	325,085	9,263
2008	1,693,323	257,043	88,073	76,400	421,516	22,561
2009	1,741,362	234,343	80,736	71,566	386,645	44,280
2010	1,886,509	275,273	92,262	82,533	450,068	21,242
2011	1,877,869	285,973	95,039	84,688	465,700	22,901
2012	1,701,827	253,068	85,083	77,252	415,403	26,268

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ජාතික පොහොර ලේකම් කාර්යාලය

අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාරය

අනෙකුත් බෝග වගාවන්ගෙන් සියයට 75 - 90 ත් අතර ප්‍රමාණයක් නියෝජනය කරන සුළු වගාකරුවන්ගේ ඵලදායිතාවය ඉහළ දැමීමට සහ ගොවීන්ගේ වගා කිරීමේ ධාරිතාව එක් බෝගයක සිට බහුවිධ බෝග වගා කිරීම දක්වා පුළුල් කිරීම සඳහාත් ගොවීන් දිරිගැන්වීම අරමුණු කර ගනිමින් රජය විසින් 2011 මැයි මස 6 වන දින සිට අනෙකුත් බෝග සඳහා වන පොහොර සහානාධාරය හඳුන්වා දෙන ලදී. ඒ සමගම මෙම වැඩසටහන මඟින් පොහොර භාවිතා කරන්නන් සඳහා විවිධ වර්ගයේ මිශ්‍ර හා මිශ්‍ර නොකළ පොහොර වර්ග විවිධ ප්‍රමාණයන්ගෙන් පෞද්ගලික අංශයේ හා රජයේ පොහොර සමාගම් සතු වෙළෙඳ සැල් හරහා ලබා ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කරන ලදී.

ඒ අනුව පොහොර භාවිතා කරන්නන් සඳහා පහත සහන සලසා දී ඇත.

- ඕනෑම වර්ගයක මිශ්‍ර නොකළ පොහොර කි.ග්‍රෑම් 50 ක බෑගයක් වෙළෙඳපොළ මිල රු. 1,200 ට වඩා වැඩි වුවද, රු. 1,200 ක සහනාධාර මිලට ලබා දීම.
- ඕනෑම වර්ගයක මිශ්‍ර නොකළ පොහොර කි.ග්‍රෑම් 50 ක බෑගයක වෙළෙඳපොළ මිල රු. 1,200 ට වඩා අඩු වන්නේ නම් එම මිලටම විකිණීම.
- කි.ග්‍රෑම් 50 ක මිශ්‍ර පොහොර බෑගයක් රු. 1,300 ට විකිණීම.

විවිධ මට්ටමේ රාජ්‍ය ආයතනය මඟින් ගත යුතු අනුමැතීන් සහ අනවශ්‍ය ලියකියවිලි නිසා ඇති වන අවහිරතා ඉවත් කිරීම තුළින් අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාරය ගොවීන්, වැවිලිකරුවන් හා සාමාන්‍ය ගෙවතු වගාකරුවන් හට විවෘත වෙළෙඳපොළ තුළින් පහසුවෙන් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසන ලදී. මෙම වැඩසටහන මඟින් බහුවිධ බෝග සඳහා නිෂ්පාදන පිරිවැය තවදුරටත් අවම කර ගැනීමට ගොවීන්ට ඉඩ ප්‍රස්ථා සැලසී ඇත.

රූප සටහන 5 - අනෙකුත් බෝග සඳහා පොහොර සහනාධාරය (කි.ග්‍රෑම් 50 ක බෑගයක් සඳහා) - 2012



මෙමගින් කි.ග්‍රෑම් 50 ක මිශ්‍ර නොකළ පොහොර බෑගයක් සඳහා රජය විසින් ලබා දී ඇති සහනාධාරය වෙළෙඳපොළ මිලෙන් සියයට 43.1 සිට 80.8 දක්වා පරාසයක වේ. දැනට සාර්ථකව ක්‍රියාත්මක වන "දිවිනැගුම" හා ගෙවතු දශ ලක්ෂයේ වැඩසටහන සඳහා මෙමගින් ලබා දෙන දායකත්වය මෙම වැඩසටහනේ තවත් ප්‍රධාන ප්‍රතිලාභයක් වන අතර එය දේශීය ආර්ථිකය නංවාලමින් ජීවනෝපාය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී ඇත.

පසුගිය වසර 5 තුළ අනෙකුත් බෝග සඳහා වන මුළු රසායනික පොහොර භාවිතය 2008 වසරේ දී මෙ.ටො. 170,020 සිට 2012 වසර වන විට මෙ.ටො. 380,829 දක්වා සියයට 124 කින් වර්ධනය වී ඇත.

2012 වර්ෂයේ දී රජය විසින් පොහොර සහනාධාර වැඩසටන වෙනුවෙන් රු. 36,456 ක පිරිවැයක් දරණ ලද අතර එය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 0.5 ක් පමණ වේ. පොහොර භාවිතා කරන්නා විසින් දරනු ලබන වියදම සැලකිල්ලට ගත් විට රටේහි පොහොර සඳහා දරණ සමස්ත වියදම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1 කට ආසන්න වේ.

වගුව 17 - අනෙකුත් බෝග සඳහා රසායනික පොහොර භාවිතාය, 2008 - 2012

බෝගය	2008	2009	2010	2011	2012	ප්‍රතිශතක වර්ධනය 2008-2012
තේ	113,418	171,659	193,474	169,534	195,593	72
රබර්	7,552	7,150	10,825	14,291	15,559	106
පොල්	16,872	17,625	26,502	54,194	45,710	171
එළවළු	18,553	23,353	31,566	51,719	66,494	258
වෙනත් බෝග	13,625	12,881	19,312	45,585	57,473	322
එකතුව	**170,020**	**232,668**	**281,679**	**335,323**	**380,829**	**124**

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

රූප සටහන 6 - පොහොර සහනාධාරය සඳහා රජය දරණ ලද වියදම 2005 - 2012



පොහොර සහනාධාර වැඩසටහනේ විශේෂිත ක්‍රියාමාර්ග

- අඛණ්ඩ සැපයුමක් සහතික කිරීමට ප්‍රමාණවත් මට්ටමක ආරක්ෂිත පොහොර තොග පවත්වා ගැනීම.
- රසායනික පොහොර අධි භාවිතය වළක්වාලීමෙන් රසායනික හා කාබනික පොහොර යෝග්‍ය මිශ්‍රණයකින් භාවිතා කිරීම ප්‍රවර්ධනය සඳහා දැනුවත් කිරීම.
- පොහොර සහනාධාරය සඳහා ඇතුළත් වන වී ගොවීන් සඳහා වගා රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- පිළිගත් තත්ත්ව සහතික ඇතුළත්ව නිෂ්පාදනය කර, ලංකා පොහොර සමාගම හරහා, කි.ග්‍රෑම් 50 කාබනික පොහොර බෑගයක් රු. 400 ක සහතික මිලකට සැපයීමට සුළු හා මධ්‍ය පරිමාණ කාබනික පොහොර නිෂ්පාදකයින් දිරිගැන්වීම.

2.7 සුළු හා මධ්‍ය පරිමාණ හා ක්ෂුද්‍රමූල්‍ය අංශ සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විදේශීය මූල්‍ය ව්‍යාපෘති

2.7.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය පිළිබඳ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය

ප්‍රාදේශීය නිමවුම් හා රැකියා අවස්ථාවන් වැඩි කරමින් ප්‍රාදේශීය අසමතුලිතතාවට පිළියමක් වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය පිළිබඳ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය 2008 මැයි මාසයේ දී ආරම්භ කළ අතර එය සියයට 81 ක සාර්ථක ප්‍රගතියක් සහිතව 2012 අගෝස්තු මාසයේ දී අවසන් විය.

වගුව 18 - ව්‍යාපෘතියෙහි සමස්ත ප්‍රගතිය

ආයතනය	වෙන් කළ මුදල (ඇ.ඩො. මිලියන)	නිදහස් කළ මුදල (ඇ.ඩො. මිලියන)	උපයෝජන අනුපාතය
ආසියානු සංවර්ධන බැංකුව	50	40.37	80.74%
සහභාගීත්ව වාණිජ බැංකු	16.67	13.70	82.18%
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය	22.00	18.02	81.91%
එකතුව	**88.76**	**72.09**	**81.22%**

මූලාශ්‍රය: සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

ව්‍යාපෘතියෙහි ප්‍රගතිය

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය වෙත රු. මිලියන 4,261.88 වටිනා ණය 966 ලබා දී ඇත.
- බස්නාහිර පළාත හැර අනෙකුත් පළාත් සඳහා කෘෂිකාර්මික අංශය ද ඇතුළුව විවිධ අංශ 21 කට ණය ලබා දී ඇත.
- සෘජු හා වක්‍ර රැකියා අවස්ථාවන් 15,892 ක් උත්පාදනය කර ඇත.
- විවිධ අංශ සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ණය ලබා දී පෙර හා පසු සබඳතා ඇති කරමින් වටිනාකම් දාමයන් සහිත ව්‍යාපාර බිහිකර ඇත.

2.7.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය නගා සිටුවීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය

2011 වසරේ දී ලෝක බැංකු අරමුදල් යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සංවර්ධන පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය ආරම්භ විය. මෙම ව්‍යාපෘතිය මඟින් නව රැකියා අවස්ථා ජනිත කිරීම තුළින් ප්‍රාදේශීය විෂමතාව අඩු කිරීම හා ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම මූලික පරමාර්ථය විය. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. මිලියන 57.4 ක් වූ අතර 2012 වසර තුළ දී සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් රු. මිලියන 1,532 ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 217 ක් අතර බෙදා දෙන ලදී. එය 2011 වසරට සාපේක්ෂව සලකා බැලීමේ දී සියයට 87 ක ණය ප්‍රදානයන්වල වර්ධනයක් හා ණය ප්‍රාමාණයන්ගේ සියයට 141 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

රූප සටහන 7 - බැංකු අනුව ණය ලබා දීමේ ප්‍රගතිය



ආංශික විශ්ලේෂණය සලකා බැලීමේ දී කෘෂි සැකසුම්, හෝටල්, ආපනශාලා හා සංචාරක, නිෂ්පාදන හා සේවා යන අංශ අනෙකුත් අංශයන්ට වඩා වැඩි මූල්‍ය පහසුකම් ප්‍රමාණයක් ලබා

ගෙන ඇත. 2012 වර්ෂයේ කෘෂි සැකසුම් අංශය රු. මිලියන 377.33 ක හා සංචාරක අංශය රු. මිලියන 297 ක මූල්‍ය පහසුකම් ලබා ගෙන ඇත. කෙසේ වෙතත්, රූපලාවන්‍ය, මෝස්තර නිර්මාණ, ධීවර, විසිතුරු මල් වගාව, විසිතුරු මසුන් ඇති කිරීම, තොරතුරු තාක්ෂණ හා මෘදුකාංග සංවර්ධන යන අංශයට ලබා දුන් ණය සංඛ්‍යාව අනෙකුත් අංශ සමඟ සැසඳීමේ දී අඩු ප්‍රගතියක් පෙන්නුම් කරයි.

හැකියා සංවර්ධන කිරීමේ සංරචක යටතේ ගත් කළ සියළුම සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තම බැංකුවල ණය හා සම්බන්ධ නිලධාරීන් 3,315 ක් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 3,586 ක් පුහුණු කළ අතර ඒ සඳහා රු. මිලියන 21.32 ක් උපයෝජනය කරන ලදී. ලංකා බැංකුව මෙයින් බැංකු නිලධාරීන් 1,149 ක් හා ව්‍යවසායකයින් 981 ක් පුහුණු කරන ලද අතර ඒ සඳහා රු. මිලියන 4 ක් භාවිතා කරන ලදි.

2.7.3 ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභගීත්වය ප්‍රවර්ධනය කිරීමේ රජයේ ප්‍රතිපත්තියට සමගාමීව ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන වසර 2010 - 2016 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො. මිලියන 25 ක් ලබා දීමට අදාළ මූල්‍ය ගිවිසුම කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) සමඟ 2010 පෙබරවාරි මස 23 වන දින අත්සන් තබන ලදී. මෙම ව්‍යාපෘතිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහනෙ සංරචකයන් මෙසේය.

1. අලෙවි දාම සංවර්ධනය හා සම්බන්ධතාවයන්
2. ක්ෂුද්‍රමූල්‍ය හා යෞවන යෞවනියන් පුහුණු කිරීම
3. වැඩසටහන් කළමනාකරණය හා ප්‍රතිපත්තිමය සහාය

කෘෂි ව්‍යාපාර අංශයේ සංවර්ධනය සඳහා වන නව්‍ය ප්‍රවේශයන් අනුගමනය කරමින් ගොවීන්ගේ/කොටස්කරුවන්ගේ කොටස් ප්‍රාග්ධන සහභාගීත්වයෙන් රාජ්‍ය සමාගම් පිහිටුවීමට මෙම වැඩසටහන මඟින් සැලසුම් කෙරිණ. එනමුත්, මෙම නව්‍ය සංකල්පය මඟින් යෝජිත ක්‍රියාත්මක යාන්ත්‍රණය, ව්‍යාපෘතියේ කටයුතු සුමටව කරගෙන යාමට අවශ්‍ය හිතකර පරිසරයක් නිර්මාණ කිරීමට අපොහොසත් බව නිරීක්ෂණය විය. එබැවින්, රජය සහ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන විසින් වැඩසටහනේ විෂය පථය සංශෝධනය කිරීමට සහ මෙම වැඩසටහන ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතට පැවරීමට හා එය දිවිනැගුම වැඩසටහන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම සඳහා තීරණය කරන ලදී.

2.7.4 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සංවර්ධන වැඩසටහන

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජර්මන් අන්තර්ජාතික සහයෝගිතාව (GIZ) හරහා යුරෝ මිලියන 2.785 ක් සැපයීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමට ජර්මනිය හා ශ්‍රී ලංකා රජය විසින් 2012 වසරේ ජුනි මස අත්සන් තබන ලදී. මෙයට අමතරව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශයේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නොවන පූර්ව කොන්දේසි වර්ධනය කිරීමේ අරමුණෙන්, ජර්මන් රජය විසින් අමතර අරමුදල් මෙම වැඩසටහන සඳහා සැපයීමට ද එකඟතාවය පළ කර ඇත.

2012 වසරේ ප්‍රගතිය

- ජාත්‍යන්තර විශේෂඥයින් මඟින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් අධීක්ෂණය සඳහා උපදේශනාත්මක හා මෙහෙයුම් කමිටු ස්ථාපිත කිරීම.
- බැංකු අංශයේ නිලධාරීන් පුහුණු කිරීම.
- අදාළ ආයතන අතර මූලික ප්‍රතිපත්තිමය සංවාදයන් ආරම්භ කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සඳහා සැලසුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව දින 4 ක වැඩමුළුවක් කාම්බෝජයේ සංවිධානය කිරීම.
- 2013 වසර සඳහා වැඩ සැලැස්ම සකස් කිරීම.
- වැඩසටහන් මෙහෙයුම් හා ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දීම.

- ජාතික ව්‍යවසායය සංවර්ධන ආයතනය (NEDA) මඟින් තාක්ෂණික සංවර්ධන අරමුදල ස්ථාපිත කිරීමට අදාළ මුලික කටයුතු ආරම්භ කිරීම.

2.7.5 ක්ෂුද්‍රමූල්‍ය ප්‍රවර්ධන ව්‍යාපෘතිය

තෝරා ගත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් සමාජයේ දිළිඳුතම ජන කොටස් හා ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායකයින් සඳහා සපයනු ලබන සේවා ඵලදායි ලෙස වැඩි දියුණු කිරීම හා ඉහළ දැමීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය සංරචක තුනකින් සමන්විත වේ.

1. ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ධාරිතා සංවර්ධනය කිරීම.
2. ක්ෂුද්‍රමූල්‍ය සේවා අංශය සංවර්ධනය කිරීම.
3. ක්ෂුද්‍රමූල්‍ය ප්‍රතිපත්තිමය හා නීතිමය රාමුවක් සංවර්ධනය කිරීම.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන ගිවිසුම 2007 මාර්තු මස ශ්‍රී ලංකාව හා ජර්මන් ජනරජය අතර අත්සන් කෙරිණ. ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියර පිළිවෙලින් වසර 2009 හා 2012 වසර වල දී නිම කරන ලදී. වැඩසටහනේ මුළු පිරිවය යුරෝ මිලියන 3.7 කි. මෙම වයපෘතිය ජර්මන් ජාත්‍යන්තර සහයෝගීතාවය (GIZ) මඟින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ අම්පාරද මඩකලපුව, යාපනය, මන්නාරම, ත්‍රිකුණාමලය, වව්නියාව, බදුල්ල, මොණරාගල, නුවරඑළිය හා පුත්තලම යන දිස්ත්‍රික්වල ක්‍රියාත්මක කෙරිණ.

ව්‍යාපෘතියෙන් ඉටු කරන ලද සුවිශේෂී කාර්යයන්

- ආයතනික වශයෙන් ක්ෂුද්‍රමූල්‍ය අංශය ශක්තිමත් කිරීම සහ එහි ප්‍රාදේශීය පදනම ව්‍යාප්ත කිරීම.
- ජනතාවට වඩා හොඳ මූල්‍ය සේවාවන් සැපයීමට හැකි වන පරිදි මූල්‍ය ආයතන 20 ක කාර්යක්ෂමතාවය අඛණ්ඩතාවය සඳහා සහාය වීම.
- හවුල්කාර ආයතන 350 ක පමණ සේවාලාභීන් සඳහා විවිධ දේශීය පුහුණු පාඨමාලා හා උපදේශණාත්මක සේවාවන් උදා: ගෘහස්ථ අරමුදල් කළමනාකරණය, ව්‍යවසායකත්ව සංවර්ධනය, නායකත්ව හා පෞරුෂත්ව සංවර්ධන පුහුණුව හා තාක්ෂණික පුහුණු වැඩසටහන් යනාදිය පැවැත්වීම.
- සාමාජික සංවිධාන 80 ක් නියෝජනය වන පරිදි ක්ෂුද්‍රමූල්‍ය ජාලයක් ස්ථාපිත කිරීම.
- නොදියුණු පළාත්හි නව සේවාලාභීන් 420,000 ක් සඳහා ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් ව්‍යාප්ත කිරීම.
- ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය අංශය සම්බන්ධයෙන් නෛතික අධ්‍යනයක් කිරීම.
- සංවාදමය වැඩමුළු මඟින් සාමාජිකයින්ගේ පළපුරුදු අත්දැකීම් බෙදා ගැනීමට සැලැස්වීම.

2.8 වෙනත්

2012 වසර තුළ දී මෙම දෙපාර්තමේන්තුව විසින් ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශ 04 ක් ද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 10 ක් ද සකස් කරන ලදී. තවද, භාණ්ඩාගාරයේ වෙනත් දෙපාර්තමේන්තු වෙත අමාත්‍ය මණ්ඩල සංදේශ 08 ක් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලබා දෙන ලදී.

ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් (භාණ්ඩාගාර නියෝජිතයන්) වශයෙන් ද අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ තාක්ෂණික ඇගයීම් කමිටුවල හා ප්‍රසම්පාදන කමිටුවල සාමාජිකයන් ලෙස ද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කටයුතු කරන ලදී.

තවද, 2012 අයවැය යෝජනා වඩා යථාර්ථවාදි හා ප්‍රායෝගික ලෙස සකස් කිරීම සඳහා විවිධ අදහස් හා යෝජනා ලබා ගැනීම අරමුණු කරගනිමින් අතිගරු ජනාධිපතිතුමා හා ගොවි සංවිධාන, වාණිජ මණ්ඩල, වෙළෙඳුන් හා අනෙකුත් අදාල පාර්ශවකරුවන් අතර පූර්ව අයවැය සාකච්ඡා පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් සලසන ලදී.

3. ආයතනික හා පරිපාලන කටයුතු

3.1 කාර්යය මණ්ඩලය

තනතුර		අනුමත කාර්යය මණ්ඩලය	මෙහෙයුම් කාර්යය මණ්ඩලය
01	අධ්‍යක්ෂ ජනරාල්	01	01
02	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	00
03	අධ්‍යක්ෂ	03	03
03	නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ	04	03
04	නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ - ගණකාධිකාරි	01	01
05	සැලසුම් සහකාර	01	01
06	පර්යේෂණ සහකාර	02	01
07	කළමනාකරණ සහකාර	04	04
08	රියදුරු	05	05
09	කා.කා.ස.	04	04
එකතුව		*26*	*23*

3.2 සංවිධාන සටහන



නි.අ.	- නියෝජ්‍ය අධ්‍යක්ෂ
ගණ.	- ගණකාධිකාරී
ස.අ.	- සහකාර අධ්‍යක්ෂ
ප්‍ර.න.නි.	- ප්‍රධාන නවීකරණ නිලධාරී
ක.ස.	- කළමනාකරණ සහකාර
රිය.	- රියදුරු
කා.කා.ස.	- කාර්යාල කාර්ය සහායක

<u>අංශ</u>

සු.ම.ප.	- සුළු හා මධ්‍ය පරිමාණ අංශය
ක්ෂුද්‍රමූල්‍ය	- ක්ෂුද්‍රමූල්‍ය අංශය
ස.මු. හා ප්‍රා.වෙ.	- සංවර්ධන මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොල

3.3 කාර්යය මණ්ඩල තොරතුරු

නම	තනතුර	සම්බන්ධ කළ හැකි තොරතුරු		
		දුරකථන	ෆැක්ස්	විද්‍යුත් තැපැල
ඩී.එස්. ජයවීර මහතා	අධ්‍යක්ෂ ජනරාල්	2484542	2394908	tspcdon@sltnet.lk dgdf@dfd.treasury.gov.lk
සී.එස්. පෙරේරා මෙය	අධ්‍යක්ෂ	2484572	2484955	christinep@dfd.treasury.gov.lk
ඒ.එච්.එස්. ෆරීඩා මෙය	අධ්‍යක්ෂ	2484595	2484955	fareedah@dfd.treasury.gov.lk
එම්.කේ.ඩී.එන්. මාදම්පෙ මිය	අධ්‍යක්ෂ	2484605	2484955	nilukad@dfd.treasury.gov.lk
පී.එම්.කේ. හෙට්ටිආරච්චි මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	2484596	2484955	manjulap@dfd.treasury.gov.lk
ඩබ්ලිව්.එල්.එම්.ඒ. ලියනගේ මිය	ගණකාධිකාරි	2484596	2484955	liyanagem@dfd.treasury.gov.lk manorigl@yahoo.com
ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය	සහකාර අධ්‍යක්ෂ	2484594	2484955	ranithad@dfd.treasury.gov.lk radranitha@gmail.com
ජේ.ඩී. කොටින්කඩුව මෙය	සහකාර අධ්‍යක්ෂ	2484854	2484955	dilrukshij@dfd.treasury.gov.lk jdilkotinkaduwa@yahoo.com
එච්.පී.එස්. ශාන්ත මහතා	සැලසුම් සහකාර	2484884	2484955	shantha@dfd.treasury.gov.lk
ඒ.එම්. වික්‍රමසිංහ මෙය	පර්යේෂණ සහකාර	2484884	2484955	amanthiw@dfd.treasury.gov.lk
සී. අස්සලාරච්චි මිය	කළමනාකරණ සහකාර	2484855	2484955	-
පී.එච්.එස්. සමරවික්‍රම මිය	කළමනාකරණ සහකාර	2484862	2484955	-
ටී. හේවාවසම් මිය (2012.01.05 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	කළමනාකරණ සහකාර	2484855	2484955	-
ඊ.ඩබ්ලිව්. සීලවති මෙය	කළමනාකරණ සහකාර	2484862	2484955	-
ජේ.එම්.අයි.ඒ. ගීෂානි මෙය *	තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර	2484884	2484955	-
එම්.එන්.එල්. ප්‍රේමතිලක මයා	රියදුරු	2484855	2484955	-
කේ.ආර්.පී. හේමචන්ද්‍ර මයා (2012.02.22 දින ස්ථාන මාරු වී ගොස් ඇත.)	රියදුරු	2484855	2484955	-
ඩී.ඒ. ජයරත්න මයා (2012.08.10 දින ස්ථාන මාරු වී ගොස් ඇත.)	රියදුරු	2484855	2484955	-
එච්.පී.ආර්. සමරසිංහ මයා (2012.01.05 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	රියදුරු	2484855	2484955	-

නම	තනතුර	සම්බන්ධ කළ හැකි තොරතුරු		
		දුරකථන	ෆැක්ස්	විද්‍යුත් තැපැල
ඩබ්.ඒ. උපාලි මයා (2012.01.05 දින ස්ථාන මාරු වී පැමිණ 2012.08.08 ස්ථාන මාරු වී ගොස් ඇත.)	රියදුරු	2484855	2484955	-
කේ.ඩී. කීර්තිරත්න මයා (2012.06.12 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	රියදුරු	2484855	2484955	-
එස්.ඒ. කීර්තිසේන මයා (2012.08.08 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	රියදුරු	2484855	2484955	-
ආර්.පී.ජේ. හැන්ටන් මයා (2012.08.17 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	රියදුරු	2484855	2484955	-
පී.ඒ.ඒ. ප්‍රනාන්දු මයා (2012.04.02 ස්ථාන මාරු වී ගොස් ඇත.)	කාර්යාල කාර්ය සහයක	2484855	2484955	-
එච්.සී.කේ. ජයසිංහ මෙය	කාර්යාල කාර්ය සහයක	2484855	2484955	-
ආර්.එම්. කුලතුංග මයා (2012.01.02 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	කාර්යාල කාර්ය සහයක	2484855	2484955	-
කේ.පී.අයි. චමින්ද මයා (2012.01.04 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	කාර්යාල කාර්ය සහයක	2484855	2484955	-
ජේ.එම්.ඩී.ජේ.එස්. හේමන්ත මයා (2012.04.04 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	කාර්යාල කාර්ය සහයක	2484855	2484955	-

* *සේවා අවශ්‍යතාවය මත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර ඇත.*

3.4 දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

නිලධාරියාගේ නම	පාඨමාලාවෙහි නම	පාඨමාලා කාලය	පැවැත්වූ ආයතනයෙහි නම
සී.එස්. පෙරේරා මෙය අධ්‍යක්ෂ	රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය දැනුවත් කිරීමේ වැඩසටහන	2012.07.19-2012.07.20	මිලෝදා ආයතනය
ඒ.එච්.එස්. ෆරීඩා මෙය අධ්‍යක්ෂ	ගිණුම්කරණ හා මූල්‍ය කළමනාකරණ වැඩසටහන	2012.09.19-2012.09.20	ශ්‍රී ලංකා මහ බැංකුව
එම්.කේ.ඩී.එන්. මාදම්පෙ අධ්‍යක්ෂ	රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය දැනුවත් කිරීමේ වැඩසටහන	2012.07.19-2012.07.20	මිලෝදා ආයතනය
ඩබ්ලිව්.එල්.එම්.ඒ. ලියනගේ මිය ගණකාධිකාරි	මූල්‍ය හිඟය පාලන ක්‍රමවේදය,ණය හා ණය කළමනාකරණ උපායමාර්ග වැඩසටහන	2012.02.16-2012.02.17	මිලෝදා ආයතනය
ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය සහකාර අධ්‍යක්ෂ	මූල්‍ය හිඟය පාලන ක්‍රමවේදය,ණය හා ණය කළමනාකරණ උපායමාර්ග වැඩසටහන	2012.02.16-2012.02.17	මිලෝදා ආයතනය
ටී. හේවාවසම් මිය කළමනාකරණ සහකාර	ඉංග්‍රීසි සන්නිවේදන ඩිප්ලෝමාව	2012.05.10-2013.04.04	මිලෝදා ආයතනය
ජේ.එම්.අයි.ඒ. ගීෂානි මෙය තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර	මෘදුකාංග සංවර්ධන ඩිප්ලෝමාව	2011.08.01-2012.08.03	ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය
එම්.එන්.එල්. ප්‍රේමතිලක මයා රියදුරු	ආරක්ෂිත, විද්‍යාත්මක හා ආර්ථිකමය රිය පැදවීම පිළිබඳ පුහුණු වැඩසටහන	2012.03.02 (එක් දින)	ඉදි කිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය
	රියදුරන් සඳහා වන පුහුණු වැඩසටහන	2012.10.09-2012.10.12	ජර්මානු කාර්මික පුහුණු ආයතනය
ආර්.පී.ජේ. හැන්ටන් මයා රියදුරු	රියදුරන් සඳහා වන පුහුණු වැඩසටහන	2012.10.22-2012.10.25	ජර්මානු කාර්මික පුහුණු ආයතනය
කේ.ඩී. කීර්තිරත්න මයා රියදුරු	රියදුරන් සඳහා වන පුහුණු වැඩසටහන	2012.10.22-2012.10.25	ජර්මානු කාර්මික පුහුණු ආයතනය
එස්.ඒ. කීර්තිසේන මයා රියදුරු	රියදුරන් සඳහා වන පුහුණු වැඩසටහන	2012.10.16-2012.10.19	ජර්මානු කාර්මික පුහුණු ආයතනය

3.5 විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

නිලධාරියාගේ නම	පාඨමාලාවෙහි නම	පාඨමාලා කාලය	පැවැත්වූ රටෙහි නම
ඩී.එස්. ජයවීර මයා අධ්‍යක්ෂ ජනරාල්	පිරිසිදු වාතාශ්‍රයේ ගුණත්වය පිළිබඳ සම්මේලනය - 2012	2012.12.03- 2012.12.08	හොංකොං
සී.එස්. පෙරේරා මෙය අධ්‍යක්ෂ	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සංවර්ධනය පිළිබඳ නිපුණතා සංවර්ධන වැඩසටහන	2012.10.22- 2012.10.27	කාම්බෝජියා
ඒ.එච්.එස්. ෆරීඩා මෙය අධ්‍යක්ෂ	පෞද්ගලික අංශයේ වර්ධනයට මඟ සැලසීම හා ආකර්ෂණීය සෘජු විදේශ ආයෝජන පිළිබඳ වැඩසටහන	2012.07.10- 2012.07.21	සිංගප්පූරුව
	දැනුම් හුවමාරු කිරීම පිළිබඳ වැඩසටහන	2012.11.19- 2012.11.24	කොරියාව
පී.එම්.කේ. හෙට්ටිආරච්චි මයා සහකාර අධ්‍යක්ෂ	ජපන් අන්තර්ජාතික විශ්ව විද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධිය	2010.08.03- 2012.07.04	ජපානය
ජේ.ඩී. කොටින්කඩුව මෙය සහකාර අධ්‍යක්ෂ	පශ්චාත් උපාධිය ප්‍රතිපත්තිමය ආර්ථික විද්‍යාව	2011.08.12- 2012.06.06	ඇමරිකා එක්සත් ජනපදය
එච්.පී.එස්. ශාන්ත මහතා සැලසුම් සහකාර	සංවර්ධන වෙමින් පවතින රටවල සඳහා සාර්ව ආර්ථික සංවර්ධනය	2012.09.06- 2012.09.26	චීනය
ඒ.එම්. වික්‍රමසිංහ මෙය පර්යේෂණ සහකාර	ආර්ථික සංවර්ධන උපායමාර්ග පිළිබඳ වැඩසටහන	2012.06.05- 2012.06.25	කොරියාව

4. මූල්‍ය තොරතුරු

වැය විෂය	ඇස්තමේන්තුව (රු.)	සත්‍ය වියදම (රු.)
පුනරාවර්තන වියදම්	358,900,500	315,775,337
පුද්ගල පඩි නඩි	9,870,000	9,797,887
ගමන් වියදම්	772,240	757,232
සැපයීම්	1,598,210	1,581,385
නඩත්තු වියදම්	1,120,000	1,094,413
සේවා	1,310,790	1,051,291
සංවර්ධන සහනාධාර (පොළී සහනාධාර)	343,921,260	301,186,121
වෙනත් මාරු කිරීම්	308,000	307,008
මූලධන වියදම්	**2,164,617,000**	**1,560,816,339**
මූලධන වත්කම් අත්පත් කර ගැනීම.	300,000	254,972
ධාරිතා ගොඩනැංවීම	400,000	125,565
ක්ෂුද්‍ර මූල්‍ය අංශය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (ProMiS-GTZ)	1,530,550	1,530,546
කුඩා හා මධ්‍ය පරිමාණ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය (SMERDP)	625,400	625,393
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය නගා සිටුවීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය (SMEDeF)	2,024,374,600	1,546,472,911
ජාතික කෘෂිව්‍යාපාර සංවර්ධන වැඩසටහන (IFAD)	136,917,000	11,806,952
සුළු හා මධ්‍ය පරිමාණ අංශය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (GTZ)	469,450	0
මුළු එකතුව	**2,523,517,500**	**1,876,591,676**